# 21 සන්ධ්‍යා මෙහෙය හා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය

අපමණ සෙත මට සැලසූ සමිඳුට
දිවි හිමියෙන් මම තුති පුදමි
අසරණ මා හට සරණ වූ දෙවිඳුට
නිරතුරු මම බැති ගී ගයමි

මාගේ ආත්මය සමිඳුන් ගැන උදම් අනන්නේ ය;
මාගේ හෘදය ගැලවුම්කාර දෙවිඳුන් තුළ ප්‍රීති වන්නේ ය;
මක්නිසාද යත් එතුමාණෝ තම දාසියගේ අසරණකම කෙරෙහි කරුණාවෙන් සිය නෙත් යොමු කළ සේක.

අහෝ බලන්න සියලු පරම්පරාවෝ මතු කලට මට භාග්‍යවන්තී යයි කියන්නෝ ය.
මක්නිසාද යත් බලවත් වූ තැනැන් වහන්සේ මට මහත් දේ කළ සේක.
උන් වහන්සේගේ නාමය සුවිශුද්ධ ය.
උන් වහන්සේ උඩගු සිතැති සියලු දෙන සිය සිතුවිලි සමග විසිර වූ සේක.
සාගින්නෙන් පෙළෙන්නන් හොඳ දෙයින් පෝෂණය කළ සේක.
ධනවතුන් හිස් අතින් යාමට සැලසූ සේක.
පිතා පුත්‍රයා සහ ශුද්ධාත්මයාණන්ට තුති වේවා
දනුත් සදහටත් මහිමය වේවා

(කිතුනු ගී 387)

ශුද්ධ වූ ලූක් තුමාගේ සුබාරංචියේ 1:46-55 පදනම් කර ගෙන මෙම ගීතිකාව නිර්මාණය වී ඇත. මරිය තුමියගේ උදාන ගීය (මග්නිෆිකාත්) ලෙසින් මෙය හඳුන්වනු ලබයි. මරිය තුමියගේ උදාන ගීය මෙනෙහි කරනු ලබන අනිවාර්ය අවස්ථාවක් ලෙස "සන්ධ්‍යා යාම යැදුම" දැක්විය හැකි ය.

## යාම යැදුම



21.1 රූපය - යාම යැදුමෙහි නිරත වන අවස්ථාවක්

"යාම යැදුම" යනු දවසේ නිශ්චිත කාල වේලාවල දී විශේෂයෙන් ම ගීතාවලියේ තෙහිලි ගී පදනම් කර ගෙන සිදු කෙරෙන ප්‍රශංසා යාච්ඤා පිළිවෙතකි. දවසේ නිශ්චිත යාමවල (වේලාවල) දී මෙය සිදු කෙරෙන නිසා මෙය "යාම යැදුම" ("LITURGY OF THE HOURS") ලෙස නම් කර ඇත.

"යාම යැදුම" අපගේ යාච්ඤා සම්ප්‍රදායයට එක් වූ නව යැදුම් ක්‍රමයක් නොවේ. එය ඉපැරණි සාම්ප්‍රදායික බයිබලීය යැදුමකි. ජුදා ජනතාව ධර්මශාලාවල (සිනගෝගවල) කළ යැදුම්වල දී ගීතාවලියේ ගීත භාවිත කළහ. මෙම යැදුම තුළ ගීතාවලියේ ගීතිකා අනිවාර්යයෙන් ම භාවිත වේ.

මුල් කාලයේ දී මෙම යැදුම් මෙහෙය පූජක, පැවිදි හා ගිහි ජනතාව අතර ප්‍රචලිත ව පැවතුණි. පසුකාලීන ව එයට සංකීර්ණ මුහුණුවරක් එක් වීම නිසා ගිහි ජනතාව ඉන් බැහැර වීය. පූජක හා පැවිදි පිරිස අනිවාර්යයෙන් දිනපතා ම යාම යැදුම උච්චාරණය කළ යුතු ය.

ජුදා සිරිතට අනුව මංගල්‍යයක් ආරම්භ කරනු ලබන්නේ මංගල්‍යය දිනට පෙර දින සවස හිරු බැස යාමත් සමග ම ය. අපගේ දේවස්ථානයන්හි මංගල්‍යය පවත්වන දිනට පෙර දින "සන්ධ්‍යා මෙහෙය" හෙවත් "වෙස්පර්ස්" මෙහෙය පැවැත්වෙයි. "වෙස්පර්ස්" යනු "සන්ධ්‍යා යාම යැදුම" යි. වර්තමානයේ ගිහි ජනතාව යාම යැදුමට සම්බන්ධ වන අවස්ථාවක් ලෙස සන්ධ්‍යා මෙහය දැක්විය හැකි ය. යාම යැදුම යදින අවස්ථා අනුව යාම යැදුම මෙලෙස නම් කළ හැකි ය:

1. උදෑ යාම යැදුම
2. දිවා යාම යැදුම
3. සැඳෑ යාම යැදුම
4. රාත්‍රී යාම යැදුම

**සන්ධ්‍යා මෙහෙයේ සැලැස්ම**

- ගීතිකා තුනක් (තෙහිලි ගී දෙකක් හා ශුද්ධ ලියවිලි ගීයක්) මෙනෙහි කිරීම
- (සුවිශේෂය) ශුද්ධ ලියවිලි පාඨය
- දේශනාව
- මරිමව් උදාන ගීය
- විශ්වාසකයින්ගේ යැදුම්
- ස්වාමිවාක් ආරාධනාව
- නුවාන යාච්ඤාව
- දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය

සන්ධ්‍යා මෙහෙය දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදයත් සමග නිම වේ. ජීවමාන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට අපගේ ගෞරවය පුද කරමින් අපගේ අවශ්‍යතා උන් වහන්සේ හමුවේ තබන මෙම අවස්ථාවේ දී උන් වහන්සේගේ ආශිර්වාදය අප ජීවිතවලට ගලා එයි. එබැවින් මෙම මොහොත කිතුනු අපට අතිශයින් වැදගත් ය. දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා ගන්නා අවස්ථාවේ දී දණින් වැටී එම උතුම් ආශිර්වාදය ලබා ගත යුතු ය. එමෙන් ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සත්ප්‍රසාද කරඬුවෙහි තැන්පත් කර ඇති අවස්ථාවන්හි දෙදණ නමා අපගේ ගෞරවය පුද කළ යුතු ය. සන්ධ්‍යා මෙහෙයේ දී මෙන් ම දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා දෙන තවත් අවස්ථා කිහිපයක් ලෙස;

- සෑම මාසයක ම පළමු  බ්‍රහස්පතින්දා හෝ පළමු සිකුරාදා දින
- දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය
- ධර්ම විවේක දිනවල
- තේවත්තේ රෝගීන්ගේ මංගල්‍යය දැක්විය හැකි ය.

"යාම යැදුම" විශ්වය මවාලූ දෙවි පියාණන් වහන්සේට ප්‍රශංසා කරන යැදුමකි. දේවස්ථානයේ සන්ධ්‍යා මෙහෙය සංවිධානයට සහාය දීම, දේවස්ථාන පාලක පියවරුන් හා එක් ව හැකි අයුරින් ජනවන්දනා කටයුතු සංවිධානය කිරීම, දේවස්ථානය ඇතුළත මෙන් ම පිටත අලංකාර කිරීමට සහාය වීම මෙන් ම ඉමහත් භක්තියකින් යුතු ව සන්ධ්‍යා මෙහෙයේ යාච්ඤාවලට සහභාගී වීම තුළින් යාම යැදුම සම්ප්‍රදය ඉදිරියට පවත්වා ගෙන යාමට අපට ද දායක විය හැකි ය. එය කිතුනු අපගේ යුතුකමක් ද වන්නේ ය.

## ක්‍රියාකාරකම

1. "යාම යැදුම" එලෙස හැඳින්වීමට හේතුව දක්වන්න.
2. යාම යැදුමේ දී වැඩිපුර ම භාවිත වන්නේ කුමන පොතෙන් ගත් ගීත ද?
3. ගිහි අප යාම යැදුමට අනිවාර්යයෙන් සම්බන්ධ වන අවස්ථාව කුමක් ද?
4. දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා දෙන අවස්ථා **තුනක්** නම් කරන්න.



**ජීවිතයට බිඳක්**

***දෙවි පියාණන් වහන්සේගෙන් අප ලබනා සෑම වරප්‍රසාදයක් සඳහා ම උන්වහන්සේට තුති ප්‍රශංසා කරමු.***